## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 290

### සෞඛ්‍ය අමාත්‍යාංශය

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරිම**

## பாராளுமன்ற வெளியீட்டு தொடர் இல - 290

### சுகாதார அமைச்சு

பாராளுமன்ற அரச கணக்குகள் குழுவினால் முன் வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியல் கட்டளை இலக்கம் 119(4)இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

# Parliamentary Series Number – 290

## Ministry of Health

**Submission of observations of Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)**

| | කාර්යසාධන ඇගයීම ප්‍රකාරව කාරක සභාව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා | දුර්වලතා නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ පියවර හා වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 1 | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම. | සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් රෝහල් හා අනෙකුත් ආයතන සඳහා ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇති අතර මේ වන විට ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ. |
| 2 | හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම. | සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් රෝහල් හා අනෙකුත් ආයතන සඳහා හානි පිළිබඳ ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇති අතර මේ වන විට හානි පිළිබඳ ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ. |
| 3 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබීම. | සෞඛ්‍ය ලේකම් වෙත යොමු කරනු ලබන විගණන විමසුම් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අදාල අනෙකුත් රෝහල් හා ආයතන වෙත යොමුකර පැහැදිලි කිරීම් ලබාගත යුතු අතර එලෙස පිළිතුරු ගෙන්වා ගැනීමේදී යම් කාල පමාවක් සිදුවන අතර හැකි සෑම අවස්ථාවකදීම නියමිත කාලය තුල පිළිතුරු ලබා දීම සඳහා කටයුතු කරනු ලැබේ. |
| 4 | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබීම. | අභ්‍යන්තර විගණන පරීක්ෂණයකින් පසු නිකුතු කරනු ලබන අභ්‍යන්තර විගණන වාර්තා අදාල ආයතනය වෙත ලැබී මසක් ඇතුලත එම විගණන වාර්තා සඳහා පිළිතුරු ඉදිරිපත් කල යුතු බව සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් සියළුම රෝහල් ආයතන වෙත දන්වා ඇත.<br>විගණන වාර්තා නිකුත් කරන විටද මසක් ඇතුලත පිළිතුරු යොමු කරන ලෙස අදාල ආයතන වෙත ලිඛිතව දන්වන අතර මසකට පසු පිළිතුරු ඉදිරිපත් කර නොමැති නම් අදාල ආයතන ප්‍රධානියා වෙත සිහිකැඳවීම් ලිපි යොමු කිරීමටද කටයුතු කරනු ලැබේ.<br>ඒ අනුව වර්තමානය වන විට විගණන වාර්තා යොමු කරන ලද ආයතන අතරින් සැලකිය යුතු ආයතන ප්‍රමාණයකින් නියමිත කාලය තුල විගණන විමසුම් වලට අදාල පිළිතුරු ලබා දී ඇත. |
| 5 | 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ | චක්‍රලේඛ මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් රෝහල් හා අනෙකුත් ආයතන සඳහා භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම පිළිබඳව දැණුවත් කර ඇති අතර රෝහල් හා ආයතන 64 ක් සඳහා සමීක්ෂණ මණ්ඩල අනුමත කර ඇති අතර දැනට අදාල සමීක්ෂණ කටයුතු සිදු වෙමින් පවතී. ආයතන 12 ක පමණ ගබඩා සමීක්ෂණ අංශය මඟින් සමීක්ෂණය කිරීමට |

| | | |
|---|---|---|
| | වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම. | කටයුතු යොදා ඇති අතර මොණරාගල, නාවලපිටිය, මාතලේ, ඇඹිලිපිටිය, නුවරඑළිය, රාගම පුණරුත්තාපන, ආනියාකන්ද යන රෝහල් හා AIDS මර්ධන ඒකකය හා අධිකරණ හා විෂවෙද යන ආයතන වල හා කඳාන හෙද විදුහලේ සමීක්ෂණ කටයුතු මේ වන විට සිද කරමින් පවතින අතර සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් සියළුම රෝහල් හා ආයතන වල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර මේ වන විට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. එසේම ඇමුණුම 01 හි සඳහන් පරිදි අදාල කාලය තුල භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිම කිරිමටත් අදාල වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමටත් අවශ්‍ය කටයුතු සැළසුම් කර ඇත. |
| 6 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබීම. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳ වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති අතර එක් එක් රෝහල් හා ආයතන වලට අදාල නිරීක්ෂණ පත්‍ර නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර ඉදිරියේදී සියළු නිරීක්ෂණ පත්‍ර කඩිනමින් නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| 7 | සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. | අනන්‍යතාව තහවුරු කරගත යුතු වාහන 2299 ක් අතරෙන් වාහන 1039 ක ලියාපදිංචිය සෞඛ්‍ය අමාත්‍යාංශය නමින් නොවන බව තහවුරු වී ඇති අතර ඉතිරි වාහන 1260 න් 610 ක තොරතුරු අනාවරණය වී ඇති අතර වාහන 650 ක අනන්‍යතාව තව දුරටත් තහවුරු කර ගත යුතුව ඇත. ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. |
| 8 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම. | සෞඛ්‍ය රියදුරුන් විසින් ධාවනය කරනු ලබන වාහන සඳහා 2022 හා 2023 වර්ෂයන් තුල භාවිතා කරනු ලැබූ දෛනික ධාවන සටහන් පත්‍ර එක් එක් වාහන සඳහා වෙන් වෙන්ව ගොණුගත කර 2024.01.20 දින විගණකාධිපති වෙත භාර දී ඇත. |
| 9 | සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම | අමාත්‍යාංශය සතු සියළුම වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරිම සඳහා 2024.02.07 දින මිල ගණන් කැඳවා ඇත. |
| 10 | වාහනයක් ගර්භිත වී මාස 08 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම. | පසුගිය කාල වකවානුව තුල වාහන අපහරණය ප්‍රමාද වී ඇති බව දන්වන අතර 2024.01.29 දින වාහන ලියාපදිංචි වාහන 40 ක් හා අබලි වාහන ලෙස වාහන 30 ක් වශයෙන් වාහන 80 වෙන්දේසි කර ඇත. |

| | | |
|---|---|---|
| 11 | රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබීම. | සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් වාහනයක් අනතුරකට පත් වූ විට මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම හා ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල් හා සියළුම සෞඛ්‍ය ආයතන ප්‍රධානීන් ලිපියක් මඟින් දැණුවත් කර ඇති අතර (ඇමුණුම 04) මුදල් රෙගුලාසි අනුව සම්පූර්ණ කර නොමැති අනතුරු සම්බන්ධයෙන් අදාල ආයතන වෙතින් තොරතුරු ගෙන්වා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |
| 12 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබීම | රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 30/2016 විධි විධාන ප්‍රකාරව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින සියළුම රෝහල් වල හා ආයතන වල පවතින වාහන වල ඉන්ධන පරීක්ෂාව සඳහා සුදුසු ආකෘතිපත්‍රයක් හඳුන්වාදෙන ලද අතර ඒ අනුව ඉන්ධන පරීක්ෂාව සිදු කිරීම යාවත්කාලීන වෙමින් පවතී. |
| 13 | මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබීම. | මහා භාණ්ඩාගාරයේ උපදෙස් මත අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර නොගන්නා ලෙස රෝහල් හා සෞඛ්‍ය ආයතන දැණුවත් කර ඇත. |
| 14 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම. | 2021.12.31 දිනට රු. මිලියන 129.23 ක් වූ අයනොවන ණය ශේෂයන් අතරින් රු. මිලියන 32.37 ක් 2023.12.31 දින වන විට අය වී ඇත. වසරකට වැඩි හිඟ ණය ශේෂයන් අයකර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ආයතනයන් වෙත ලබා දී ඇති අතර මෙම වර්ෂය තුලදී හැකි පමණ හිඟ ණය ශේෂයන් අය කිරීමට කටයුතු කරනු ලැබේ. |
| 15 | පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබීම. | වසර 02 ඉක්මවූ පොදු තැන්පත් ශේෂ මු.රෙ.571 ප්‍රකාරව නිරවුල් නොකිරීමට හේතු වී ඇත්තේ තැන්පත්කරුවන් විසින් මෙතෙක් ඉල්ලීම් ඉදිරිපත් නොකිරීම, නිතිමය කටයුතු අවසන් නොවීම හා අදාල තැන්පතු තව දුරටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගනීමට සිදුවීම යන කරුණු මතයි.<br>මෙම තැන්පතු බොහොමයක් ගොඩනැඟිලි අංශයට අදාල වන අතර එම තැන්පතු ගොඩනැඟිලි ඉදිකිරීම් වලට අදාලව තැන්පත් කරන ලද රඳවා ගැනීම් වන අතර මින් බොහොමයක් කොන්ත්‍රාත් ආයතනයන් විසින් මෙතෙක් ඉල්ලීම් ඉදිරිපත් නොකල ඒවා වේ. කෙසේ වෙතත් වසර 02 ක ඉක්මවූ පොදු තැන්පත් ශේෂ මු.රෙ.571 ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කරන ලෙසද අදාල ආයතන දැණුවත් කර ඇත. |

| | | |
|---|---|---|
| 16 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබීම. | මු.රෙ.371(5) සහ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ 01/2020 අනුව අත්තිකාරමක් ලබාගෙන ඊට අදාල කාර්යය අවසන් කොට දින 10 ක් තුල එම අත්තිකාරම පියවීමට කටයුතු කල යුතු බවත් අත්තිකාරම් මුදල් ලබාගත් කටයුත්ත අවලංගු වුවහොත් නැවත පියවීම් සිදුකර අත්තිකාරම් මුදල් නැවත ඉල්ලුම් කර අදාල කාර්යය ඉටු කර ගන්නා ලෙසටත් එක් එක් අංශ දැණුවත් කර ඇත. එසේම තත්කාර්යය අතුරු අග්‍රිමය ලබාගෙන එවැනි අග්‍රිම දෙකක් පියවා නොමැති නිලධාරීන්ට නැවත අග්‍රිම නිකුත් නොකල යුතු බවටද මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීමේදී දැණුවත් කර ඇත. |
| 17 | රැස්කර තිබුණු ආදායම්, සෘජුවම ආදායමට බැර කර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැර කර හෝ නොතිබීම | එක් එක් ආයතන විසින් රැස් කරනු ලබන ආදායම්, සෘජුවම ආදායමට බැර කිරීමටත් එසේ නොවන අවස්ථාවලදී ඒවා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැර කරන ලෙසටත් ඒ අනුව සියළුම රෝහල් හා සෞඛ්‍ය ආයතන වලට උපදෙස් ලබා දී ඇත. |
| 18 | අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබීම. | වෛද්‍ය සේවාවේ සහ සංවර්ධන නිලධාරී සේවාවේ අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය ඇති අතර වෛද්‍ය සේවාවේ අනුමත කාර්ය මණ්ඩලය ඉහළ නංවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇත. |

දෙවැනි කොටස - **62.00**

| | **කාර්යසාධන ඇගයීම ප්‍රකාරව කාරක සභාව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා** | **දුර්වලතා නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ පියවර හා වර්තමාන තත්ත්වය** |
|---|---|---|
| 1 | පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබීම. | අමාත්‍යාංශයට අදාල පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර එහි සිංහල පිටපත අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙහි පලකර ඇත. මෙම ලේඛනය විද්‍යුත් ප්‍රකාශනයක් ලෙස හා වරින් වර යථාවත් කල හැකි වනසේ වෙබ් අඩවියට ඇතුලත් කර ඇති අතර මෙහි ඉංග්‍රීසි පරිවර්තනයේ මෘදු පිටපත වෙබ් අඩවියට ඇතුලත් කිරීමට හා පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය අමාත්‍යාංශ පරිශ්‍රය ඉදිරිපිට දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කල නොහැකි බැවින්, දර්ශන තිරයක ප්‍රදර්ශනය කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. |
| 2 | ආයතනයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබීම. | සෞඛ්‍ය අමාත්‍යාංශ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව ගැටළු පවතින්නේ නම් ක්ෂණික ඇමතුම් 1907 ඔස්සේද Whatsapp – 0707907907 ඔස්සේද විද්‍යුත් තැපැල suwasawana@health.gov.lk ඔස්සේද අමාත්‍යාංශයේ දුක්ගැනවිලි සම්බන්ධීකරණ ඒකකය වෙත දැණුම් දීමේ හැකියාවද, ප්‍රඥප්තිය සම්බන්ධයෙන් යෝජනා/චෝදනා වේ නම් දුරකථන අංක 0112670182 ඔස්සේද, ෆැක්ස් අංක |

| | | |
|---|---|---|
| | | 0112693866 ඔස්සේද විද්‍යුත් තැපැල sasinformation@health.gov.lk ඔස්සේද ජොෂ්ය සහකාර ලේකම් (ප්‍රවෘත්ති හා ප්‍රචාරණ) වෙත දැනුම් දිය හැකිය. එසේම පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර, එහි අධීක්ෂණයට හා ඇගයීමට නිසි වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට සියළු රෝහල් හා සෞඛ්‍ය ආයතන ප්‍රධානීන් දැණුවත් කර ඇත. |
| 3 | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම. | මානව සම්පත් ක්‍රමෝපායන සැලැස්ම (Human Resource Plan) 2020-2023 කෙටුම්පත් කිරීම අවසන් කර ඇති අතර ඉතා ඉක්මණින් මෙහි වැඩකටයුතු අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම සැලැස්ම පදනම් කර ගනිමින් මානව සම්පත් සැලැස්මක් පිලියෙල කිරීමටද අපේක්ෂිතය. සෞඛ්‍ය සේවාව විමධ්‍යගත සේවාවක් බැවින් මධ්‍යම රජය හා පළාත් සභා විසින් වෙනවෙනම මානව සම්පත් සැලසුම් සකස් කල යුතු වේ. |
| 4 | සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් 50% කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් වර්ෂයකට පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවන් සහතික කර නොතිබීම. | වාර්ෂිකව පුහුණු වැඩසටහන් සඳහා ලැබෙන සීමිත ප්‍රතිපාදන ප්‍රමාණය අමාත්‍යාංශය තුල හා අනුබද්ධිත ආයතනයන්හි සහ දිවයින පුරා සියළුම රෝහල්හි සිටින 80,000 ක් පමණ වූ සෞඛ්‍ය කාරය මණ්ඩලය පුහුණු කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ.<br><br>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව එම නිලධාරීන්ට අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක කාලසීමාවක් හෝ පුහුණුවක් ලබාදීම සඳහා වර්ෂයකට පුහුණු වැඩසටහන් සඳහා මිලියන 330 කට අධික ප්‍රතිපාදන අවශ්‍ය වුවත් පුහුණු වැඩසටහන් සඳහා වාර්ෂිකව ලැබෙනුයේ මිලියන 50 ක පමණ ප්‍රතිපාදන ප්‍රමාණයකි.<br><br>2023 වර්ෂයේ පුහුණු වැඩසටහන් සඳහා මිලියන 50 ක ප්‍රතිපාදන ලද අතර මෙමඟින් මූලික පුහුණු පාඨමාලා 15ක අදාල විභාග කටයුතු, පර්යේෂණ සම්බන්ධ කටයුතුද ඇතුලත්ව පුහුණු වැඩසටහන් 800 කට අධික ප්‍රමාණයක් දිවයින පුරා පවත්වා ඇති අතර 5000 කට අධික ප්‍රමාණයකට පුහුණු අවස්ථා ලබා දී ඇත. |
| 5 | සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබුණු පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට වඩා අඩු මට්ටමක පැවතීම. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් ප්‍රමාණවත් ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉල්ලා සිටියද 2024 වර්ෂය සඳහාද ලැබී ඇත්තේ මිලියන 50 ක ප්‍රතිපාදන පමණි. පුහුණු වැඩසටහන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරන්නේ නම් පුහුණු අවස්ථා සම්පූර්ණ කල හැකිය. |
| 6 | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාචන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය. | අහිතකර විගණන මතයට හේතු වූ අදාල කරුණු නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |
| 7 | විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබීම. | විගණකාධිපති වාර්තාවේ සඳහන් නිර්දේශ සහ රාජ්‍ය ගිණුම් කාරක සභාවේ අනු කමිටු මඟින් ලබා දි ඇති නියෝග නියමිත කාලය තුල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |

| | | |
|---|---|---|
| 8 | සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබීම. | 1988 අංක 74 දරන පනතින් සංශෝධිත පරිදි ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලයේ සේවය කරන විධායක නිලධාරීන් විසින් අදාල සෑම වර්ෂයකම ජුනි 30 දින වන විට මධ්‍යම පරිපාලන ශාඛාව වෙත භාරදීමට කටයුතු කරනු ලැබේ. මේ පිළිබඳව වාර්ෂිකව සියළුම මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් දැණුවත් කරන අතර 2024 වර්ෂය සඳහාද මේ වන විට අංශ ප්‍රධානීන් දැණුවත් කර ඇත. |
| 9 | නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ. 156(1) ප්‍රකාරව අයකිරීම් කර නොතිබීම. | 2021 වර්ෂය තුල පරීක්ෂණ නිමකර රු. 2,393,089/- ක මුදලක් රජයට අයකරගෙන ඇත. |
| 10 | මු.රෙ. 119 ප්‍රකාරව අයකල යුතු අධිභාර අයකර නොතිබීම. | අයනොකල අධිභාර වාර්තා වී නොමැත. |
| 11 | උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබීම. | ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් වාර්ෂික ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු කිරීමට කටයුතු කරන බවත් වෛද්‍ය සේවාව හා අනෙකුත් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් තනතුරු සඳහා ස්ථාන මාරු කිරීම ඒ ඒ තනතුරු වලට අදාල පරිපාලන අංශ මගින් සිදු කරනු ලබයි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම් කටයුතු මේ දිනවල මධ්‍යම පරිපාලන ශාඛාව විසින් සිදු කරමින් පවතී. |

වෛද්‍ය රමේෂ් පතිරණ,
සෞඛ්‍ය අමාත්‍ය

**වෛද්‍ය රමේෂ් පතිරණ පා.ම.**
සෞඛ්‍ය අමාත්‍ය
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය" අංක 385,
පූජ්‍ය බද්දේගම විමලවංශ නාහිමි මාවත,
කොළඹ 10.